# ප්‍රවෘත්ති නිවේදනය
## PRESS RELEASE
සෞඛ්‍ය අමාත්‍යාංශය | சுகாதார அமைச்சு | Ministry of Health

Telephone Office: 2671181 / Gen: 2694033 / 2669192 / 2675011 / 2675449 / Fax: 2689540


**2023.11.09**

| | |
|---|---|
| **11** | **08** |

**ප්‍රවෘත්ති අධ්‍යක්ෂ / ප්‍රවෘත්ති කර්තෘ / ප්‍රවෘත්ති සංස්කාරක,**

**රට ආර්ථිකව ශක්තිමත් කරන්න නම් නිෂ්පාදන කර්මාන්තයන් වැඩි කළ යුතුයි.........**
**– සෞඛ්‍ය හා කර්මාන්ත අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ**

ශ්‍රී ලංකාව තුළ ස්ථාවර නිෂ්පාදන කර්මාන්ත නොමැති නම් රට ආර්ථික වශයෙන් අස්ථාවර බවත් පසුගිය කාලය තුළදී එහි අවශ්‍යතාවය දැඩිව පෙන්නුම් කල බව සෞඛ්‍ය හා කර්මාන්ත අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ මහතා අවධාරණය කරයි.

අමාත්‍යවරයා මේ බව අවධාරණය කරන ලද්දේ දේශීය ඖෂධ නිෂ්පාදකයින් සමග අද දින (09) සෞඛ්‍ය අමාත්‍යාංශයේ පැවති සාකච්ජාවකදී අදහස් දක්වමිනි. ඖෂධ නිෂ්පාදකයින් හට පවතින ගැටලු පිළිබඳවත් සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඔවුන් අතර සුහදතාවය වර්ධනය කර ගැනීමේ අරමුණින් මෙම සාකච්ජාව පැවැත්විණි.

එහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් අමාත්‍යවරයා කියා සිටියේ, මෙරටට අවශ්‍ය ඖෂධ මෙරට තුළ නිෂ්පාදන කල යුතු බවත් ඒ සඳහා අවශ්‍ය සහය රජයක් ලෙසත් සෞඛ්‍ය අමාත්‍යාංශය විදිහටත් නොඅඩුව ලබාදීමට කටයුතු කරන බවයි. එහිදී ඒ සියල්ල පැහැදිලි විනිවිදභාවයකින් සිදුවිය යුතු බවත් අවධාරණය කල අමාත්‍යවරයා පියවරෙන් පියවර මෙය විධිමත් කිරීම ඉතා අත්‍යවශ්‍ය කරුණක් බවත් තමන් කර්මාන්ත අමාත්‍යවරයා වශයෙනුත් මෙහි අවශ්‍යතාවය තමන්ට ද දැඩිව පෙනී ගොස් ඇති බවද පැවසීය.

එමෙන්ම ඖෂධ කර්මාන්තය පිළිබඳව මෙරට ජනතාව තුළ තිබෙන ප්‍රතිරූපය යහපත් එකක් නොවන බවත් සෞඛ්‍ය අමාත්‍යාංශය හා සෞඛ්‍ය අමාත්‍යවරයා දෙසත් ජනතාව අපහැදිලි කෝණයකින් බලන බවද, තමන්ට අවශ්‍ය එම ප්‍රතිරූපය නිවැරදි හා පැහැදිලි කර දීම බවද පැවසූ අමාත්‍යවරයා විදේශ රටවලින් මෙරටට ඖෂධ ආනයනය කිරීමට වඩා රටතුළ නිෂ්පාදනය සිදු කිරීමෙන් විශාල මුදල් ප්‍රමාණයක් රටතුළ ඉතිරිකර ගැනීමට හැකිවන බවද අසල්වැසි ඉන්දියාව, පාකිස්ථානය, බංගලාදේශය වැනි රටවල් ඖෂධ නිෂ්පාදනයෙන් විශාල ආදායම් ලබන බවද පෙන්වා දුන්නේය.

ඖෂධ නිෂ්පාදකයින් හට කළයුතු ගෙවීම් නිසි ක්‍රමවේදයට අනුකූලව ගෙවීමට කටයුතු කරන ලෙසට මෙහිදී නිලධාරීන්ට අමාත්‍යවරයා උපදෙස් දුන් අතර දේශීය ඖෂධ නිෂ්පාදකයින් ලබාගන්නා ඖෂධ ඇනවුම් නිසි කලට වේලාවට ලබාදීමෙන් ඖෂධ හිඟය මග හරවා ගැනීමට හැකියාව පවතින බවත් නව ඖෂධ ලියාපදිංචි කිරීම් කර ගැනීමට අවශ්‍ය නම් ඊට අදාල ලියකියවිලි ජාතික ඖෂධ නියාමන අධිකාරියට යොමු කර ක්‍රමවේදයන්ට අනුකූලව අවශ්‍ය අනුමැතිය ගන්නා ලෙසත් අමාත්‍යවරයා ඖෂධ නිෂ්පාදකයින් දැන්වීය.

මෙරට ඖෂධ අවශ්‍යතාවයෙන් 15% - 20% ප්‍රමාණයක් රටතුළ නිෂ්පාදනය කරන අතර ඉතිරි සියල්ල විදේශ රටවලින් ආනයනය කරනු ලබයි. ඒ සඳහා වාර්ෂිකව රජය ඩොලර් මිලියන 700 කට අධික මුදලක් වැය කරයි. වාර්ෂිකව ඖෂධ වර්ග 1347 ක් මෙරටට ආනයනය කරනු ලබයි. ප්‍රමුඛතා ලේඛනය මත ඖෂධ වර්ග 862 ක් රෝගී ප්‍රතිකාර සඳහා යොදා ගැනෙන අතර එයින් ඖෂධ වර්ග 208 ක් මෙරට තුළ නිෂ්පාදනය කරනු ලබයි.

මෙම අවස්ථාවට සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍ය විශේෂඥ වෛද්‍ය සීතා අරඹේපොල, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ජනක චන්ද්‍රගුප්ත, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සභාපති විශේෂඥ වෛද්‍ය ආනන්ද විජේවික්‍රම, රාජ්‍ය ඖෂධ සංස්ථාවේ සභාපති වෛද්‍ය අජිත් මෙන්ඩිස්, වෛද්‍ය සැපයුම් අංශයේ අධ්‍යක්ෂ වෛද්‍ය කපිල වික්‍රමනායක යන මහත්ම මහත්මීන් සහ දේශීය ඖෂධ නිෂ්පාදකයින් පිරිසක්ද සහභාගී වූහ.


**චමින්ද කරුණාරත්න**
**අධ්‍යක්ෂ (මාධ්‍ය)**
**0711741741**

ප්‍රවෘත්ති නිවේදනය
PRESS RELEASE
සෞඛ්‍ය අමාත්‍යාංශය | சுகாதார அமைச்சு | Ministry of Health
Telephone Office: 2671181 / Gen: 2694033 / 2669192 / 2675011 / 2675449 / Fax: 2689540

2023.11.09

| | |
|---|---|
| 11 | 08 |

செய்தி இயக்குனர் / செய்தி ஆசிரியர்

நாட்டின் பொருளாதாரத்தை வலுப்படுத்த, உற்பத்தித் தொழில்கள் அதிகரிக்கப்பட வேண்டும் – சுகாதார மற்றும் கைத்தொழில் அமைச்சர் டொக்டர் ரமேஷ் பத்திரன

இலங்கையில் நிலையான உற்பத்தி கைத்தொழில்கள் இல்லாவிட்டால், நாடு பொருளாதார ரீதியில் ஸ்திரமற்ற நிலைக்குத் தள்ளப்படும் என சுகாதார மற்றும் கைத்தொழில் அமைச்சர் டொக்டர் ரமேஷ் பத்திரன வலியுறுத்துகிறார்.

சுகாதார அமைச்சில் உள்ளூர் மருந்து உற்பத்தியாளர்களுடன் இன்று (09) இடம்பெற்ற கலந்துரையாடலில் அமைச்சர் இதனை வலியுறுத்தினார். சுகாதார அமைச்சுக்கும் மருந்து உற்பத்தியாளர்களுக்கும் இடையிலான நட்புறவை வளர்க்கும் நோக்கில் இந்த கலந்துரையாடல் இடம்பெற்றது.

அங்கு மேலும் கருத்து தெரிவித்த அமைச்சர், நாட்டுக்கு தேவையான மருந்துகளை நாட்டிலேயே உற்பத்தி செய்ய வேண்டும் எனவும், அதற்கு தேவையான ஆதரவை அரசாங்கமும் சுகாதார அமைச்சும் வழங்கும் எனவும் தெரிவித்தார். இவையனைத்தும் தெளிவாகவும் வெளிப்படைத்தன்மையுடனும் மேற்கொள்ளப்பட வேண்டுமெனவும், இதனை படிப்படியாக முறைப்படுத்துவது மிகவும் இன்றியமையாதது எனவும் அமைச்சர் வலியுறுத்தினார்.

அத்துடன், இலங்கையின் மருந்துத் துறையின் பிம்பம் நல்லதல்ல என்றும், சுகாதார அமைச்சையும், சுகாதார அமைச்சரையும் மக்கள் தெளிவில்லாத

கோணத்தில் பார்ப்பதாகவும், அந்தப் படத்தை திருத்தி தெளிவுபடுத்த விரும்புவதாகவும் அமைச்சர் கூறினார். நாட்டில் பெருமளவு பணத்தை மிச்சப்படுத்த முடியும் என்றும் அண்டை நாடுகளான இந்தியா, பாகிஸ்தான், பங்களாதேஷ் போன்ற நாடுகள் மருந்து உற்பத்தி மூலம் பெரும் வருமானம் பெறுவதாகவும் அவர் சுட்டிக்காட்டினார்.

மருந்து உற்பத்தியாளர்களுக்கு உரிய முறையில் பணம் செலுத்துமாறும், உள்ளூர் மருந்து உற்பத்தியாளர்கள் மூலம் பெறப்படும் மருந்து ஆர்டர்களை உரிய நேரத்தில் வழங்குவதன் மூலம் மருந்து தட்டுப்பாட்டை தவிர்க்க வாய்ப்பு உள்ளதாகவும், தேவைப்பட்டால் பதிவு செய்து கொள்ளுமாறும் அமைச்சர் அதிகாரிகளுக்கு அறிவுறுத்தினார். புதிய மருந்துகள், உரிய ஆவணங்கள் தேசிய மருந்து ஒழுங்குமுறை ஆணையத்திடம் சமர்ப்பிக்கப்பட வேண்டும்.அமைச்சர் மருந்து உற்பத்தியாளர்களை அதிகாரசபைக்கு பரிந்துரைத்து, நடைமுறைகளுக்கு ஏற்ப தேவையான அனுமதிகளைப் பெறுமாறு அறிவுறுத்தினார்.

நாட்டின் மருந்துத் தேவைகளில் 15% - 20% உள்நாட்டில் உற்பத்தி செய்யப்படுகிறது, மீதமுள்ளவை வெளி நாடுகளில் இருந்து இறக்குமதி செய்யப்படுகின்றன. இதற்காக அரசாங்கம் ஆண்டுதோறும் 700 மில்லியன் டாலர்களுக்கு மேல் செலவிடுகிறது. இலங்கையில் வருடாந்தம் 1347 வகையான மருந்துகள் இறக்குமதி செய்யப்படுகின்றன. முன்னுரிமை பட்டியலில் உள்ள நோயாளிகளின் சிகிச்சைக்காக 862 வகையான மருந்துகள் பயன்படுத்தப்படுகின்றன, இதில் 208 வகையான மருந்துகள் நாட்டில் உற்பத்தி செய்யப்படுகின்றன.

சுகாதார இராஜாங்க அமைச்சர் டொக்டர் சீதா அரம்பேபொல, சுகாதார அமைச்சின் செயலாளர் ஜனக சந்திரகுப்த, சுகாதார சேவைகள் பணிப்பாளர் நாயகம் டொக்டர் அசேல குணவர்தன, தேசிய மருந்து ஒழுங்குமுறை அதிகார சபையின் தலைவர் டொக்டர் ஆனந்த விஜேவிக்ரம, அரச மருந்து கூட்டுத்தாபனத்தின் தலைவர் டாக்டர் அஜித் மெண்டிஸ்

ஆகியோர் கலந்துகொண்டனர். , மருத்துவ வழங்கல் பிரிவின் பணிப்பாளர் டொக்டர் கபில விக்கிரமநாயக்க இந்நிகழ்வில் கலந்துகொண்டார். மற்றும் உள்ளூர் மருந்து உற்பத்தியாளர்கள் குழுவினரும் கலந்துகொண்டனர்.



**சமிந்த கருணாரத்ன**
**ஊடக பணிப்பாளர்**
**0711741741**